# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2021 සැප්තැම්බර් මස 10 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2021.09.10 දින නිකුත් කරන ලදී)**


## තරුණ වරදකරුවන් (පුහුණු පාසල්) (සංශෝධන)

**(25 වන අධිකාරය වූ) තරුණ වරදකරුවන් (පුහුණු පාසල්) ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

අධිකරණ අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 6.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (25 වන අධිකාරය වූ) තරුණ වරදකරුවන් (පුහුණු පාසල්) ආඥාපනතේ 4 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ ස්ත්‍රී පුරුෂ මධ්‍යස්ථභාවය මත ආඥාපනතේ විධිවිධාන අදාළ කරගැනීම වේ.

***3 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ ස්ත්‍රී පුරුෂ මධ්‍යස්ථභාවය මත ආඥාපනතේ විධිවිධාන අදාළ කරගැනීම වේ.

***4 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ "තරුණ තැනැත්තා" යන යෙදුම වයස අවුරුදු දහඅට සම්පූර්ණ වූ එහෙත් වයස අවුරුදු විසිදෙක සම්පූර්ණ නොවූ තැනැත්තකු වශයෙන් නැවත අර්ථ නිරූපණය කිරීම වේ.

# තරුණ වරදකරුවන් (පුහුණු පාසල්) (සංශෝධන)

එල්.ඩී.—ඕ. 27/2019

## (25 වන අධිකාරය වූ) තරුණ වරදකරුවන් (පුහුණු පාසල්) ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:–

*ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය*

1. මේ පනත 2021 අංක දරන තරුණ වරදකරුවන් (පුහුණු පාසල්) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

*25 වන අධිකාරයේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම*

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (25 වන අධිකාරය වූ) තරුණ වරදකරුවන් (පුහුණු පාසල්) ආඥාපනතේ 4 වන වගන්තියේ, (1) වන උපවගන්තියේ "යම් පිරිමි තැනැත්තකු" යන වචන වෙනුවට "යම් තැනැත්තකු" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම*

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "පිරිමි තැනැත්තකු" යන වචන වෙනුවට "තැනැත්තකු" යන වචනය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම*

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තියේ "තරුණ තැනැත්තා" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

> " "තරුණ තැනැත්තා" යන්නෙන් වයස අවුරුදු දහඅටට සම්පූර්ණ වූ එහෙත් වයස අවුරුදු විසිදෙක සම්පූර්ණ නොවූ තැනැත්තකු අදහස් වන අතර, "තරුණ වරදකරු" යන්නට ඊට අනුරූප අර්ථයක් ඇත.".

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව*

5. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.